# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2023.03.30

වේලාව : පෙ.ව. 10.45

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

**මූලාසනය : ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව(බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප) |
| 04) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප) |
| 07) | චන්දන රණවීර ආරච්චි මහතා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප) |
| 08) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | කේ.ජී.එස්.ප්‍රසන්න මයා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | ආර්.එම්.ජී.ඒ. බණ්ඩාර | - | සහකාර ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප) |
| 16) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 17) | එස් .ඩී.තෙවරප්පෙරුම මහතා | - | අධ්‍යක්ෂ, ක්‍රීඩා අමාත්‍යාංශය (බ.ප) |

**ප්‍රදීප් යසරත්න**
**ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත**

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | ගෙවතු වගා වැඩසටහන සම්බන්ධව | 2023 වර්ෂයේ ගෙවතු වගා තරඟාවලිය බාණ්ඩ අටක් යටතේ පැවැත්වීමට සැලසුම් කර ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශ සහකාර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>රු.100 ක වටිනාකමින් යුත් බීජ පැකට් ගෙවතු 308000ක් සඳහා ලබා දීමට සැලසුම් කර ඇති අතර අප්‍රේල් 20 දින සිට සතියක් තුල දිස්ත්‍රික් තුන සඳහා එම බීජ පැකට් බෙදා දීමට සූදානම් කරන බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 02 | ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේ ගැටළුව සම්බන්ධව | මෙම ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුවන බවට ප්‍රාදේශීය ලේකම් දන්වා ඇති අතර එහි භුක්තිය සම්බන්ධව සඳහනක් නොමැති බවත් , පාපන්දු සම්මේලනයේ පවතින අභ්‍යන්තරික ගැටළුකාරී තත්ත්වයක් හේතුවෙන් එම සම්මේලනය මේ පිළිබඳ කටයුතු කිරිමට කල් ඉල්ලා ඇති බවත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව මේ පිළිබඳ නැවත වරක් සාකච්ඡා කිරිමට කටයුතු කලයුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 03 | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | කාර්ය සාධන තරඟාවලිය සඳහා මෙතෙක් අයදුම් කර නොමැති ආයතන සඳහා අයදුම් කිරිමේ කාල සීමාව අප්‍රේල් 10 වන දින දක්වා දීර්ඝ කිරීමට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා දෙන ලදී.<br>තවද කාර්ය සාධන තරඟාවලිය සඳහා ඉල්ලුම්පත් යොමුකර නොමැති ආයතන සම්බන්ධ ලේඛණයක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරතුමා දැනුම් දී ඇති බවට ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී.<br>එමෙන්ම මෙම තරඟාවලියේ විනිශ්චය මණ්ඩල සඳහා හා ආසන්නතම අධීක්ෂණ නිලධාරීන්ට මේ සම්බන්ධව පුහුණුවක් ලබා දිය යුතු බව සාකච්ඡා විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 04. | බස්නාහිර පළාත් සභා FB ගිණුමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව | මේ වන විට FB ගිණුමේ පලකිරීම සඳහා ආයතන වලින් තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර තම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු , ආයතන වලින් සිදු කරනු ලබන වැඩසටහන් වලට ප්‍රචාරණයක් ලබා දීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 05. | ආණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරගාවලිය සම්බන්ධව | අණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරඟාවලිය සම්බන්ධ යෝජනාව ගරු අණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇති බවත් ආණ්ඩුකාර තුමා සමඟ සාකච්ඡා කර ඒ සම්බන්ධව කමිටුවක් පත්කර ඉදිරි කටයුතු දැනුම් දෙන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 09. | ප්‍රතිපාදන මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබෙන ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරනු ලබන අත්‍යාවශ්‍යම ව්‍යාපෘති අනුමැතිය ලබා ගන්නා තෙක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට හා ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට මූල්‍ය අංශය වෙත යොමු කරන ලෙසත් අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.ඒ අනුව ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් මුදලක් මෙම වසරට නොලැබුනහොත් 2024 වසරේ ලැබෙන ප්‍රතිපාදන වලින් එම හිඟ බිල්පත් ගෙවීමේ හැකියාව සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br><br>තවද දැනට ලැබී ඇති ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය ඉදිරිපත් කරමින් පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ ලැබුණු ප්‍රතිපාදන වලින් පළාත් පාලන අමාත්‍යාංශයට ලැබුණු රුපියල් මිලියන 500 න් රුපියල් මිලියන 422 ක්ද , සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණු රුපියල් මිලියන900 න් රුපියල් මිලියන 832 ක්ද , කෘෂිකර්ම අමාත්‍යාංශයට ලැබුණු රුපියල් මිලියන 650 න් රුපියල් මිලියන 360 ක්ද , අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණු රුපියල් මිලියන 850 න් රුපියල් මිලියන 426 ක්ද , ප්‍රවාහන අමාත්‍යාංශයට ලැබුණු රුපියල් මිලියන 450න් රුපියල් මිලියන 276 ක්ද ව්‍යාපෘති සඳහා යොදවා ඇති බවත් ,සෞඛ්‍ය අංශ සංවර්ධන ප්‍රදාන සඳහා රුපියල් මිලියන1444 න් රුපියල් මිලියන 612 ක්ද ,අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති සඳහා ලැබුණු රුපියල් මිලියන 440කින් රුපියල් මිලියන177 ක් ව්‍යාපෘති සඳහා යොදවා ඇති අතර අලුත් වැඩියා කටයුතු සඳහා ලැබුණු ප්‍රතිපාදන රුපියල් මිලියන 2588ක් පවතින බවටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් ) විසින් කරුණු සඳහන් කරන ලදී.<br><br>තවද ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති සම්බන්ධව වැඩි දුරටත් සාකච්ඡා කළ අතර කටුගහහේන අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ නාන කාමර පද්ධතියේ උපාංග සවි කිරීමට මිලියන 13 ක මුදලක් අවශ්‍ය වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. ආණ්ඩුකාර තුමා විසින් එම ගොඩනැගිල්ල් අධීක්ෂණය කිරීමට නියමිත බැවින් එය 2023.04.06 දිනට පෙර සකස් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 10. | පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා සඳහා පළාත් සභා කැඳවීම සම්බන්ධව | පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වෙත වෙත කැඳවීමක් කරන අවස්ථාවලදී පිළිතුරු දීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් පෙර සූදානම්ව ඒ සඳහා සම්බන්ධ විය යුතු බව ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී.<br><br>ඒ අනුව 2023.04.17/18 හා 19 යන දිනවල මේ පිළිබඳ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා සූදානම්ව අනිවාර්යයෙන් සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන් මෙන්ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් , ප්‍රධාන නීති නිලධාරී ,හා අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාදායක ආයතන ප්‍රධානීන් සහභාගී විය යුතු බවට ප්‍රධාන ලේකම් විසින් තව දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 11 | නිලධාරීන්ට විදේශ අධ්‍යාපන නිවාඩු ලබා දීම සම්බන්ධව | නිලධාරීන් සඳහා වැටුප් සහිත විදේශ නිවාඩු ලබා දීමේදී වඩාත් සැලකිලිමත් විය යුතු බවට ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී.ඒ අනුව දැඩි අධීක්ෂණයකින් යුතුව අදාළ චක්‍රලේඛ අනුගමනය කරමින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) මගින් නිරීක්ෂණ ලබා ගෙන එම නිවාඩු ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 06. | ආබාධිත පුද්ගලයන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමේදී අඩු ආදායම් සීමාව යාවත්කාලීන නොකිරීම සම්බන්ධව | අඩු ආදායම්ලාභීන්ට විවිධ සහනාධාර ලබා දීම සඳහා පළාත් සභාව විසින් රු.6000/= ක් හෝ ඊට අඩු ලෙස අදායම් සීමාව සලකා බැලීමට 2011.12.28 දින පැවති පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයක් මත ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද්දක් බව අනාවරණය වූ බැවින් මේ සම්බන්ධව කාලීන සීමා සංශෝධනය කර සීමා නියම කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දන්වා සිටින ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 07. | බස්නාහිර පළාත් අමාත්‍යාංශවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධව | දැනට පවතින පුරප්පාඩු ප්‍රමාණය අග්‍රමාත්‍ය ලේකම් කාර්යාලයේ රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලොචනය කිරීමේ කමිටුව වෙත යැවීමට කටයුතු කර ඇති බවත් එම පුරප්පාඩු වලින් අත්‍යාවශ්‍යම පුරප්පාඩු සඳහා 50% ක් හෝ සම්පූර්ණ කර දීමට කටයුතු කරන බවට අග්‍රාමාත්‍ය ලේකම් විසින් ප්‍රකාශ කර ඇති බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>තවද බහුකාර්ය සේවා දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලේඛනවල සඳහන් පුද්ගලයින්ට පත්වීම් ලබා දීම සඳහා පවත්වන සම්මුඛ පරීක්ෂණ 2023.04.05 හා 2023.04.07 දිනවලදී පැවැත්වීමට කටයුතු කරන බවත් ඒ සඳහා පුද්ගලයින් 1500 කගේ නම් ලයිස්තුවක් ලැබී ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද 3000 ක් පමණ පුරප්පාඩු පවතින අතර එම පුරප්පාඩු පිරවීමට , පුරප්පාඩු නොපවතින පළාත් වලින් බහු කාර්ය නිලධාරීන් ලබාගෙන එම පුරප්පාඩු පිරවීම සම්බන්ධව හා ඔවුන්ට පහසුවන පරිදි අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු පවතින කාර්යාලවල සේවයේ යෙදවීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>එම බඳවා ගන්නා බහු කාර්ය නිලධාරීන් සඳහා මෙම වසරට වැටුප් ගෙවීම සඳහා බහු කාර්ය දෙපාර්තමේන්තුව මගින් ඉතිරිව ඇති ප්‍රතිපාදන ලබා දෙන බව දැනුම් දී ඇති අතර තවත් හිඟ මුදලක් පවතී නම් මුදල් අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් සිදු කරන ලෙස දැනුම් දී ඇති අතර ඉදිරි වර්ෂ සඳහා වැටුප් ගෙවීමට අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කරන අවස්ථාවේදී ඉල්ලීම් කරන ලෙසත් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 08. | නිල නිවාස සන්තකය ආපසු ලබා ගැනීමට බලය පැවරීම සම්බන්ධව | පළාත් සභාවට අයත් ප්‍රධාන ලේකම් භාරයේ පවතින රජයේ නිවාසවල පදිංචි වී සිටින අනවසර පදිංචිකරුවන් සඳහා නඩු පැවරීමට ප්‍රධාන ලේකම් වෙත බලය පවරා ඇත.එසේම ඒ ඒ අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙතද එම බලය ඒ ඒ අමාත්‍යාංශ වෙනුවෙන් පවරා ඇත.<br>මේ වන විටත් බස්නාහිර පළාත් සභාවට අයත් රජයේ නිල නිවාසවල අනවසර පදිංචිකරුවන් සිටින බවට ප්‍රධාන නීති නිලධාරී කරුණු ඉදිරිපත් කළ අතර ඒ අනුව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් එසේ අනවසරයෙන් පදිංචි වී සිටින පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙස දැනුම්දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12. | ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කිරීම | ඇතැම් අමාත්‍යාංශ ලේකම්වරුන් සමහර කරුණු සම්බන්ධව කිසිදු සොයා බැලීමකින් තොරව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කරන අතර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් වගකීම හඳුනාගෙන එම වගකීම තමන් විසින් දැරිය යුතු බවත් සුළු සුළු කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට ලිපි යොමු නොකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | බස්නාහිර පළාත් ස(ර්)වරය තුල කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් වෙබ් අඩවිය පවත්වාගෙන යන ICTA ආයතනයේ ස(ර්)වරය තුල කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ස්ථාපනය කර ස්වාධීනව පවත්වාගෙන යාමට පහසුකම් සලසා දීම සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියෙන් විමසන ලදී.<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ස්වාධීන වෙනමම ගොඩනගා ගත්තක් වන අතර එය සයිබර් ප්‍රහාරයකටද ලක්වී ඇත. මෙම වෙබ් අඩවියේ සංවර්ධන කිරීමේදී ITRD ආයතනය සම්බන්ධ වී නැත. මේ සඳහා වෙනමම සර්වර් යන්ත්‍රයක් භාවිතා කිරීම වඩා සුදුසු බව තොරතුරු තාක්ෂණ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීමට තිරණය කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 14. | 2023 මත් ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර පුනරුත්ථාපන සැලැස්ම | බස්නාහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් මඟින් ලබාගත් තොරතුරු පාදක කර ගනිමින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් සකස් කරන ලද 2023 වර්ෂය සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 15. | ප්‍රායෝගික පුහුණු ලාභීන් ලෙස තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධව | තාක්ෂණ නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධව පවතිනකාර්ය මණ්ඩල හිඟයට පිළියමක් වශයෙන් ජාතික ආධුනිකත්ව මණ්ඩල හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ අධ්‍යයන කටුයතුවල නියුතුව සිටින ශිෂ්‍යයින් බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ වලකටයුතු සම්බන්ධව ප්‍රායෝගික පුහුණු ලාභීන් ලෙස බඳවා ගැනීම තුලින් විශාල කාර්ය භාරයක් සිදුකරගත හැකි බවටත් , මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට තාක්ෂණ නිලධාරීන්ගේ සේවය සම්බන්ධව දැඩි අවශ්‍යතාවයක් පවතින බවටත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී .<br>ඒ අනුව ක්‍රියා කිරීම සුදුසු බවට සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිසු පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16. | ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු හා සේවා කටයුතු සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ සවිකර ඇති උපකරණ සම්බන්ධව වාර්ෂිකව නඩත්තු හා සේවා කටයුතු විශාල ප්‍රමාණයක් සිදුවන අතර එම උපකරණ ලබාගත් ආයතන මඟින්ම එය සිදු කිරීමට වසර පහක ගිවිසුමකට බැඳී ඇත.ඒ අනුව එම ආයතන වලට නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව පළාත් සභා අරමුදලින් විශාල වියදමක් දැරීමට සිදුව ඇත.<br>ඒ අනුව 2023.07.15 දින වන විට වසර පහ සම්පූර්ණ වන බැවින් එම ආයතන නඩත්තු හා සේවා කටයුතු වලින් බැහැර කිරීමේ හැකියාවක් පවතින අතර ඉදිරියේදී එම කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යොදා ගැනීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව නඩත්තු සඳහා මේ වන විට වැයවන මුදල ඉතාමත් අධික බව වැඩි දුරටත් සාකච්ඡා කළ අතර ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කිරීම සුදුසු බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත